**ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 5,388.41 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,139.09 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,249.32 ක් හෙවත් සියයට 23.18 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 740.72 | 660.64 | 80.08 | 10.81 |
| මූලධන | 4,647.69 | 3,478.45 | 1,169.24 | 25.16 |
| **එකතුව** | **5,388.41** | **4,139.09** | **1,249.32** | **23.18** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම.

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 15.00 | 14.11 | 3.50 | 6.33 | 24.00 | 20.07 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0385/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 26,183 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 4.53 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0056/000 | 2.88 |
| 6000/0000/00/0016/0037/000 | 1.65 |
| **එකතුව** | **4.53** |

## 2.5 විගණන නිරීක්ෂණය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

අමාත්‍යාංශය විසින් පහත සඳහන් එක් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර තවත් ලේඛන දෙකක් යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශ | පවත්වා නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 10601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට හිඟ හිට තිබුණු වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු රු.120,023 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශාය විසින් එම වාර්තා 2017 ජුනි 23 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) 2016 වර්ෂයට අදාළ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථාන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව භාණ්ඩ වර්ග 04 කට අයත් අයිතම 06 ක ඌනතාවයක් හා ඔරුගොඩවත්ත

ගබඩාවේ භාණ්ඩ වර්ග 52 කට අයත් අයිතම 42,215ක ප්‍රමාණයක ඌනතාවයන් නිරීක්ෂණය වී තිබුණි. ඔරුගොඩවත්ත ගබඩාවෙන් නිකුත් කර තිබුණු භාණ්ඩ තොග පිළිබඳ සටහන් පොත්වලට ඇතුළත් කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හිටපු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා වෙත නිකුත් කර තිබුණු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හෝ ඒවාට අදාළ ලැබීම් නියෝග ගෙන්වා ගෙන නොතිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පරිහරණය සඳහා වාහන 32 ක් නිදහස් කර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු රු.3,848,889 ක් වටිනා රූඩ් 3යි පර්චස් 36.5ක ඉඩම හා මහල් 4 ක ගොඩනැගිල්ල 2012 වර්ෂයේ සිට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 261(1) | | අංක පිළිවෙලට වවුචර් සකසා නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 268,604 | නිකුත් කරන ලද අතුරු අග්‍රිමයන් අදාළ කාර්ය නිමකළ විගසම පියවීමට කටයුතු නොකළ අවස්ථා අනාවරණය විය. |

**(ආ)** **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**-------------------------------------**

| | | |
|---|---|---|
| 2.7, 2.8, 5.4.4, 5.6 සහ 6.3.3 මාර්ගෝපදේශ | 59,613,750 | සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට පටහැනිව මෝටර් වාහන 02 ක් මිලදී ගෙන තිබුණි. තවද, ඒ සඳහා පිළිගත හැකි සුරක්ෂණයන් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. |

**3.5** **කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

**පශ්චාත් ආපදා සහන කටයුතු**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 ඔක්තෝබර් 20 හා 21 දිනවල ඔරුගොඩවත්ත ගබඩාවේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී කල් ඉකුත් වූ හා කල් ඉකුත් වීමට ආසන්න ආහාර ද්‍රව්‍ය තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව පීඩාවට පත් පාර්ශවයන්ට ආහාර බෙදාහැරීම සඳහා ලැබී තිබුණු සහල් ටොන් 4 1/2 ක්, වතුර බෝතල් 89 ක්, කිරිපිටි කි.ග්‍රෑ.27 ක් හා බිස්කට් පැකට් විශාල ප්‍රමාණයක කල් ඉකුත් වූ තොග පැවති බව අනාවරණය විය. ඒ අනුව ආපදා අවස්ථාවන්වලදී පීඩාවට පත් පුද්ගලයින් වෙත ලබාදීම සඳහා දේශීය හා විදේශීය විවිධ ආයතනවලින් ලැබෙන ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 මැයි 17 දින කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදු වූ නායයෑම් හේතුවෙන් 2017 අගෝස්තු 31 දින වන විටත් සුරක්ෂිත මධ්‍යස්ථාන 18 ක් තුළ පවුල් 282 ක් සිටි බව නිරීක්ෂණය විය. කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ යෝජනාවක් පරිදි ප්‍රතිලාභින් තමන් විසින්ම නිවාස ඉදිකර ගැනීමටත් ඒ සඳහා වාරික වශයෙන් වන්දි මුදල් නිදහස් කිරීමටත් කටයුතු කර තිබුණි. ඒ අනුව අදාළ නිවාසවල ඉදිකිරීම් නිමවන තෙක් අවතැන්වූ පුද්ගලයන් සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා තබන ලද බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විගණනය වෙත දැනුම්දී තිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 |
| (ii) | තෘතීයික මට්ටම | 06 | 02 | 04 |
| (iii) | ද්විතීයික මට්ටම | 444 | 393 | 51 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 34 | 12 |
| | **එකතුව** | **519** | **449** | **70** |